# ආර්ථික සංවර්ධනයේ දී කැපුම් මල්, කැපූ අතු - රිකිලි හා විසිතුරු මල් කර්මාන්තයේ දායකත්වය

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින ආර්ථිකයක සංවර්ධන ක්‍රියාමාර්ගයක් ලෙස කුඩා පරිමාන කර්මාන්ත දිරිමත් කිරීමේ අවශ්‍යතාවය ඉතා වැදගත් වූවකි.

ආර්ථික විද්‍යාඥ ඩඩ්ලි සියර්ස් දක්වන පරිදි "කිසියම් රටක සේවා වියුක්තිය අඩුවී තිබේ ද? එම රටෙහි දුප්පත්කම අඩු වී තිබේ ද? එම රටේ ආදායම් බෙදීයාමේ විෂමතාවයක් නොපවතී ද ? එවැනි ගුණාංග වලින් යුත් රටක් සංවර්ධනය වූ රටකි."

දියුණු වෙමින් පවතින රටවල් රාශියක ප්‍රධාන නිෂ්පාදන අංශය කෘෂිකර්මාන්තය වන අතර වර්තමානය වන විට කෘෂි අංශයෙන් උත්පාදනය කළහැකි රැකියා ප්‍රමාණය සීමිත මට්ටමක පවතී. සමහර අවස්ථාවන්හි දී කෘෂි අංශයෙන් උපයන ආදායම්, අවිනිශ්චිත වන අවස්ථා ද තිබේ. ශ්‍රී ලංකාව වැනි කෘෂි කාර්මික රටක බහුතරය කෘෂිකර්මයේ නියැලෙයි. මෙම පිරිස ග්‍රාමීය ආර්ථිකයක් තුළ ජීවත් වන්නේ වුවද, කෘෂිකර්මාන්තය නම් තවමත් ආකර්ශනීය ජීවනෝපයක් වී නොමැත. වර්තමාන තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තය කෙරෙහි දක්වන උනන්දුව දැඩි ලෙස පහත වැටී තිබේ. මේ තත්ත්වයෙන් මුදවා ආර්ථික ප්‍රතිලාභ ජනතාව වෙත ගලා යාමට නම් මූලික වශයෙන් කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථික රටාවකට ජනතාව යොමු කරවිය යුතුය. ඒ තුළින් රටක් සංවර්ධනය නම් වූ ක්‍රියාවලියට යොමු කරවීමට හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ වැවිලි නොවන, කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි වාසි සහගත ලෙස අපනයනය කළහැකි අපනයන කර්මාන්තයක් ලෙස කැපුම් මල්, කැපූ අතු - රිකිලි හා විසිතුරු මල් පැළෑටි යනාදිය හඳුන්වා දිය හැකිය. මෙම අපනයන ද්‍රව්‍යයන් පහත සඳහන් ලෙස රේගු වාර්තා මගින් වර්ග කර දක්වා තිබේ. එනම්,

- සජීවී ගස් වර්ග, වෙනත් පැළ වර්ග හා බල්බයන් (bulbs, tubers, tuberous, roots, corms)
- සජීවී පැළ වර්ග (unrooted cutting and slip)
- ගස් වර්ග හා පඳුරු වර්ග (Trees, shrubs and bushes, graft and others)
- කැපුම් මල් හා මල් පොහොට්ටු (fresh roses, fresh carnation, fresh orchids, fresh anthuriums)
- කැපූ අතු - රිකිලි හා වෙනත් කොටස් (mosses and linches)

**වගු අංක 1**

**ශ්‍රී ලංකාවේ කැපූ මල් හා කැපූ අතු-රිකිලි අපනයනය හා අපනයන ආදායම දළ දේශීය නිෂ්පාදිතයට (ද.දේ.නි) දක්වන දායකත්වය. ( 1992-2004)**

| වර්ෂය | ප්‍රමාණය | | මුළු අපනයන වටිනාකම | සමස්ථ ද.දේ.නි.ට මල් අපනයනයේ දායකත්වය | කෘෂි ද.දේ. නිෂ්පාදිතයට මල් අපනයනයේ දායකත්වය | දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය |
|---|---|---|---|---|---|---|
| | 000' ගණනින් | මෙ.ටො | රු. මිලියන | % | % | % |
| 1993 | | 5745.5 | 256.8 | 0.06 | 0.28 | 19.9 |
| 1994 | | 1853.6 | 379.7 | 0.07 | 0.39 | 18.8 |
| 1995 | | 2326.2 | 396.7 | 0.07 | 0.37 | 17.8 |
| 1996 | 1493.9 | 1665.4 | 425.5 | 0.06 | 0.35 | 17.6 |
| 1997 | 3636 | 2192.8 | 484.8 | 0.06 | 0.35 | 17.3 |
| 1998 | 6494.2 | 2176.2 | 490.8 | 0.05 | 0.32 | 16.8 |
| 1999 | 6916.3 | 2159.4 | 572.9 | 0.06 | 0.35 | 16.4 |
| 2000 | 4825 | 2606.6 | 625.7 | 0.06 | 0.35 | 15.8 |
| 2001 | 9769.6 | 2591.3 | 723.2 | 0.06 | 0.36 | 16.0 |
| 2002 | 11681 | 2465.3 | 776.1 | 0.06 | 0.33 | 16.6 |
| 2003 | - | - | 925 | 0.06 | 0.39 | 15.2 |
| 2004 | - | - | 915 | 0.05 | 0.36 | 14.3 |

මූලාශ්‍ර - අපනයන සංවර්ධන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගු සහ
ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා.

ද.දේ.නි (GDP) - පවත්නා සාධක මිල අනුව


**එස්. ඇපාසිංහ**
*පර්යේෂණ නිළධාරී,*
**කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

වර්තමාන තරුණ පරම්පරාව මෙම කර්මාන්තය වෙත ඇදී යාමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම ද මෙම කර්මාන්තය වර්ධනය කරලීමට හැකි හේතුවක් ලෙස දැක්විය හැකිය. මෙම කර්මාන්තයේ පවතින ආකර්ශනීය භාවය එය මෙරටට හිමි කරදුන් විදේශ විනිමය ප්‍රමාණය කෙතෙක් ද යන්න මත පැහැදිලි කරයි.

වගු අංක 1ට අනුව 1993 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා කැපුම් මල්, කැපූ අතු - රිකිලි හා විසිතුරු මල් අපනයනය පිළිබඳ දත්ත දීස් වේ. මේ අනුව පැහැදිලි වන්නේ 1993 වර්ෂයේ අපනයන ආදායම රුපියල් මිලියන 256.8 ක් වූ අතර එම ප්‍රමාණය එය 2004 වර්ෂයේ රුපියල් මිලියන 915 දක්වා 256.3% ක වර්ධනයක් පෙන්නුම් කරන බවයි. 1993 වර්ෂයේ සිට මේ දක්වා මෙම කර්මාන්තයේ වර්ධනය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබෙන අතර එය තවදුරටත් පහත ප්‍රස්ථාරය අනුව පැහැදිලි කිරීමේ හැකියාව පවතී.

**ප්‍රස්ථාර අංක 1**


**මල් කර්මාන්තයේ අපනයන ආදායම**
**(1993-2004)**




මෙහි දී පවත්නා සාධක මිල අනුව (Current Factor Cost Price) දල දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂි අංශයේ දායකත්වය (දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය ඉවත් කර) වාර්ෂිකව අඩුවෙමින් පවත්නා තත්ත්වයක් ප්‍රස්ථාර අංක 1 ට අනුව පැහැදිලි කරයි. 1993 වර්ෂයේ මෙම අගය 19.9% ක්ව පැවති අතර 2004 වර්ෂය වන විට එම ප්‍රමාණය 14.3% දක්වා සීඝ්‍ර පසුබෑමකට ලක්ව තිබේ. තවදුරටත් එය ප්‍රස්ථාර අංක 2 අනුව පැහැදිලි කෙරේ.

**ප්‍රස්ථාර අංක 2**


**දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය**
**(1993-2004)**




කෘෂි අංශයේ වන මෙම දායකත්වය මෙවැනි පසුබෑමකට ලක්වන විට මල් අපනයන අංශය එය මැඩ පැවැත්වීමට යම් මට්ටමකට හෝ දායක වී ඇති බව පැහැදිලි කළ හැකිය. එනම්, කෘෂි අංශයේ දල දේශීය නිෂ්පාදිතයට 1993 වර්ෂයේ මල් අපනයන අංශයේ දායකත්වය 0.28% වූ අතර එය 2004 වර්ෂයේ 0.36% දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි. මෙහි වර්ධනය තවදුරටත් ප්‍රස්ථාර අංක 3 ට අනුව හා එහි උපනති රේඛාව (Trend Line) මගින් පැහැදිලි කෙරේ.

**ප්‍රස්ථාර අංක 3**

**කෘෂි අංශයේ දල දේශීය නිෂ්පාදිතයට මල් අපනයනයේ දායකත්වය**
**(1993-2004)**




මේ අනුව පැහැදිලි වන්නේ, කෘෂි අංශයේ දල දේශීය නිෂ්පාදනයේ දායකත්වය සඳහා මල් අපනයන අංශයේ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වන බවකි.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2004 සඳහන් කරන අන්දමට "මෙම විසිතුරු පැල හා මල් වගා අංශය සඳහා ආකර්ශනීය දේශීය හා විදේශීය වෙළඳපොළක් බිහි වී තිබේ. හෝටල් සහ නිවාස සංකීර්ණවල භූමි අලංකරණය සඳහා ඉල්ලුම වැඩිවීම, මල් සැරසිලි භාවිතය ඉහළ යාම හා කුඩා පරිමාන කර්මාන්තකරුවන්ගේ පැල ප්‍රදර්ශන වැඩිවීම නිසා දේශීය වෙළඳපොළ තුළ ද වේගවත් වර්ධනයක් පවතී. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය හා පුද්ගලික ව්‍යවසායකයින්ගේ දායකත්වය ඉවහල්වී ඇති බව ද සඳහන් කළ යුතුය." 2005 වසරේ අයවැය මගින් ද, මෙම අංශයට ලබා දී ඇති සහයෝගය සහ සෙසු සහන මගින් තවදුරටත් මෙහි වර්ධනයක් අපේක්ෂිතය.

කිනම් ආකාරයකින් මෙම අංශයේ වර්ධනයක් පැවතිය ද, මෙම කර්මාන්තය මුහුණ දෙන ගැටළු රාශියක් ක්ෂේත්‍ර අත්දැකීම් වල දී හඳුනා ගැනීමට හැකි විය. මෙම ගැටළු වලට විසඳුම් ලබාදීම තුළින් කෘෂි අංශයට වන දායකත්වය උපරිම කර ගැනීමට හැකි වනු නොඅනුමානය.

මූලිකව මෙම මල් කර්මාන්තය සඳහා මල් අපනයනකරුවන් දායක වන ආකාරය හඳුනා ගැනීම ද වැදගත් වේ. එය පහත සඳහන් පරිදි සටහන් කළ හැකිය.

i. තමන්ම මල් වගා කර අපනයන කරන අය

ii. තමන් මල් වගා කර වෙනත් අපනයන ආයතන වලට භාර දෙන අය

iii. අතරමැදියන් ලෙසින් මල් එකතු කර අපනයන ආයතන වලට භාර දෙන අය

මෙම කර්මාන්තකරුවන් තමන් සහභාගී වන ආකාරය අනුව විවිධ ගැටළු වලට මුහුණ දී සිටී. දළ දේශීය නිෂ්පාදිතයේ කෘෂි අංශයට විශාල දායකත්වයක් සපයන මෙම අංශයේ ගැටළු හඳුනා ගැනීම ද කාලීන අවශ්‍යතාවයකි.

**මල් වගාකරුවන් මුහුණ දෙන ගැටළු**

- ජාත්‍යන්තර වශයෙන් දියුණු කළ රෝපන ද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටළු
- තාක්ෂණික දැනුම ලබා ගැනීමේ ගැටළු හා එම තාක්ෂණික උපකරණවල මිල ගණන් ඉහළ යාම
  - හරිතාගාර තාක්ෂණය පිළිබඳ ගැටළු
  - බිංදු හා විසුරුම් වාරිමාර්ග ක්‍රම පිළිබඳ ගැටළු
- වගාවට අවශ්‍ය නියමිත ඉඩම් නොමැති වීම.
- කෘෂි රසායන හා පොහොර වැනි යෙදවුම්වල මිල අධික වීම.
- විධිමත් කෘෂි ව්‍යාප්ති සේවයක් නොතිබීම.
- මෙම කර්මාන්තය සඳහා විධිමත් ණය ක්‍රමයක් නොතිබීම.

**මල් අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු**

- විදේශ ගැණුම්කරුවන් සොයා ගැනීමේ දී ඇතිවන ගැටළු
- ගැණුම්කරුවන් ලිඛිත ගිවිසුම් යටතේ භාණ්ඩ නොගැනීම නිසා ඔවුනට වංචා කිරීමට හැකිවීම. (ක්ෂේත්‍ර අත්දැකීම් වලින් පැහැදිලි වේ.)
- නිෂ්පාදන ස්ථානයේ සිට ගුවන් තොටුපල දක්වා ප්‍රවාහන ගැටළු (ශීතකරණ පහසුකම් සහිත වාහන. . . .)
- ගුවන් ප්‍රවාහන වියදම් ඉහළ යාම
- ගුවන් යාතා ප්‍රමාදවීම හා ගුවන් සේවකයින්ගේ නොසැලකිලිමත් කම (මේ නිසා අපනයන ද්‍රව්‍ය බහුල වශයෙන් විනාශ වීමට භාජනය වේ.)
- ගුවන් තොටුපල ශීතාගාර ගාස්තු ඉතා ඉහළ මට්ටමක පැවතීම.
- වෙනත් රට වලින් (ඉන්දියාව, පකිස්ථානය වැනි) අඩු මිල ගණන් වලට මෙම ද්‍රව්‍ය සැපයීම නිසා එම තරඟයට මුහුණ දීමට ඇති නොහැකියාව.
- ඉහළ ඉල්ලුමක් ඇති ජපානය වැනි රට වලට අපනයන කිරීමට ප්‍රමාණවත් ගුණාත්මක තත්ත්වයක් මෙරට නිෂ්පාදන වලට නොතිබීම. (මේ සඳහා හරිතාගාර තාක්ෂණය වැදගත්ය)
- විදේශ වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීමට ඇති නොහැකියාව. (මේ තුළින් විදේශ වෙළඳ පොළ සොයා ගැනීමට හැකි වනු ඇත.)
- වෙළඳපොළට නැඹුරු වූ ස්ථාවර වෙළඳ ප්‍රතිපත්තියක් නොමැතිවීම. (ආනයන හා අපනයන තීරුබදු නිතර වෙනස්වීම.)

විශේෂයෙන්, මෙම ගැටළු වලට විසඳුම් ලබාදීම තුළින් මෙම කර්මාන්තයේ වර්ධනයක් සිදු කර කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නව ආයෝජන හා රකියා අවස්ථා ද උත්පාදනය කිරීමට හැකියාව ලැබෙයි. ඒ තුළින් මෙම කර්මාන්තයට අදාල යෙදවුම් ලබා ගැනීමේ හා බෙදාහැරීමේ පද්ධතියේ රකියා අවස්ථා රාශියක් බිහි වෙතැයි අපේක්ෂා කළ හැකිය. තව ද, කෘෂිකර්මික අංශය තුළ ඉඩම් කැබලි කුඩා වීමත් එමඟින් ලැබෙන ඵලදායීතාවය හීනවීම නිසාත්, කෘෂි අංශයට යොමු වන ශ්‍රමික පිරිස සීමිත ය. මේ නිසා, ග්‍රාමීය අංශය ආශ්‍රිත කුඩා පරිමාණයේ මල් කර්මාන්ත ව්‍යාප්ත කර රකියා අවස්ථා උත්පාදනය කිරීම තුළින් එකී අංශය තුළ වැඩිවන ශ්‍රම බලකාය, මෙම කර්මාන්තය තුළට යොමු කර ගැනීමට හැකි වේ. මෙමඟින්, සේවා වියුක්ති ගැටළු වලට විසඳුම් ලැබෙන අතර භූමිය, ජලය වැනි ස්වාභාවික සම්පත් කාර්යක්ෂමව පාලනය කිරීමට ද හැකියාව ලැබෙයි.

ලෝකයේ සංවර්ධිත රටවල ඓතිහාසික අත්දැකීම් පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ එම රටවල සංවර්ධනයට හේතු වී ඇත්තේ අපනයන ප්‍රවර්ධනය හා රාජ්‍ය මැදිහත්වීම බවයි. මෙම සෑම සංවර්ධිත රටකම සංවර්ධන ක්‍රියාවලියේ දී රජය විසින් මූලික හා වැදගත් කාර්යභාරයක් ඉටු කර තිබේ. මේ අනුව, ශ්‍රී ලංකාවේ ද රජය මැදිහත් වී දැනට මෙම කර්මාන්තයේ පවතින බාධක හා ගැටළු වලට පිළියම් යෙදිය යුතුය. එනම්, අපනයන කාර්යයේ දී ගැණුම්කරුවන් හඳුන්වාදීම හා අවශ්‍ය සේවා සැපයීම සිදු කළ යුතු අතර මල් වගාකරුවන් මුහුණ දෙන තාක්ෂණය පිළිබඳ ගැටළු, ණය පහසුකම් ලබාදීම් හා ව්‍යාප්ති සේවයේ පවතින දුර්වලතා මඟ හැරවිය යුතු වේ. 2005 වර්ෂයේ අය - වැය මඟින් ලබාදීමට යෝජිත සහාය මේ ගැටළු විසඳීම සඳහා වන්නේ නම් එය ඉතා වැදගත් වූවකි. ඒ තුළින් කැපුම් මල්, කැපූ අතු - රිකිලි හා විසිතුරු මල් කර්මාන්තයේ වර්ධනය මෙන්ම අපනයනය වර්ධනයට ද පිටුවහලකි. එය මෙරට ආර්ථික සංවර්ධනය උදෙසා මහඟු සේවාවක් ඉටු කරනු නියතය.